සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.06 / 0830 - 1030

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

49 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න.**

**1.** සමාරියාව පිහිටා ඇත්තේ
(1) මුහුදුබඩ තැනිතලා පෙදෙසේ ය. (2) බටහිර කඳු මධ්‍යයේ ය.
(3) නැගෙනහිර කඳු මධ්‍යයේ ය. (4) ගිලුණු නිම්නයේ ය.
(5) ජුදයාවේ කාන්තාරයේ ය.

**2.** 'නෙගෙබ්' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) උතුර (2) මධ්‍යම (3) නැගෙනහිර (4) බටහිර (5) දකුණ

**3.** පහත රජවරුන්ගෙන් ඊශ්‍රායලයේ දකුණු රාජ්‍යය පාලනය කළ රජතුමා කවු ද?
(1) දාවිත් රජතුමා (2) සලමන් රජතුමා
(3) රෙහොබොවාම් රජතුමා (4) සාවුල් රජතුමා
(5) ජෙරබොවාම් රජතුමා

**4.** එලිජා සහ එලිෂා යන දිවස්ප්‍රසාදිවරුන් දේශනා කළේ,
(1) උතුරු රාජ්‍යයේදී ය. (2) ගලීලයේදී ය.
(3) ජුදයාවේ කාන්තාර පෙදෙසෙහිදී ය. (4) දකුණු රාජ්‍යයේදී ය.
(5) සිරියාවේදී ය.

**5.** බැබිලෝනියාවේ විප්‍රවාසගතව සිටි ඊශ්‍රායෙල් ජාතිකයින්ව නිදහස් කළ රජතුමා කවුරුන් ද?
(1) ඩේරියස් (2) සයිරස් (3) නබුකද්නසාර් (4) ශෙඩෙකියා (5) නෙහෙමියා

**6.** ක්‍රි.පූ. 722 දී උතුරු රාජ්‍යය ආක්‍රමණය කරන ලද්දේ,
(1) ඊජිප්තුවරුන් ය. (2) සිරියානුවරුන් ය.
(3) ඇසිරියානුවරුන් ය. (4) බැබිලෝනියන්වරුන් ය.
(5) පර්සියන්වරුන් ය.

**7.** ස්පාඤ්ඤ කොලනියක් (යටත් විජිතයක්) බවට පත් වූ නැගෙනහිර ආසියානු රට,
(1) පිලිපීනයයි. (2) චීනයයි. (3) කොරියාවයි. (4) ජපානයයි. (5) තායිවානයයි.

**8.** අයිසෙක් නිව්ටන් විද්‍යාඥයා පිළිබඳව දැක්වෙන **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ඔහු දේවධර්ම ශාස්ත්‍රඥයෙකි.
(2) ඔහු විද්‍යාව සහ ශුද්ධ බයිබලය සම්බන්ධ ග්‍රන්ථ සම්පාදනය කළේ ය.
(3) ඔහු විශ්වාසය පිළිබඳ ගැටලුවකට මුහුණ දුන්නේ ය.
(4) ඔහු වෛද්‍ය විද්‍යා සොයාගැනීම් සම්බන්ධයෙන් නොබෙල් ත්‍යාගය දිනා ගත්තේ ය.
(5) ඔහු මුහුදේ වඩදිය-බාදිය ගැලීම සම්බන්ධයෙන් න්‍යායක් ඉදිරිපත් කළේ ය.

**9.** 'ගොතික්' යන වචනයෙහි තේරුම කුමක් ද?
(1) අහස දෙසට නික්මුණ උල් වූ කොත් තිබීම
(2) කුළුණු ගණනාවක් ඇති ගොඩනැගිල්ල
(3) වර්ණවත් වීදුරුවලින් අලංකාර වූවක් වීම
(4) මූර්ති කැටයම්වලින් සමන්විත වීම
(5) ම්ලේච්ඡ හෝ නීරස

**10.** තමා ඉදිරිපත් කළ විද්‍යාත්මක අදහස් නිසා දෝෂ දර්ශනයට ලක් වූ තැනැත්තා වන්නේ,
(1) ඇල්බට් අයින්ස්ටයින් ය.
(2) සර් අයිසෙක් නිව්ටන් ය.
(3) තෙයියාර් ඩි ෂාර්ඩෑන් පියතුමා ය.
(4) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් ය.
(5) ඇලෙක්සැන්ඩර් ෆ්ලෙමින් ය.

**11.** ශ්‍රී ලංකාවේ දක්නට ඇති අයිකොන් පින්තූර සම්බන්ධයෙන් හොඳම නිදසුන වන්නේ,
(1) මඩු දේවමාතාවන්ගේ පින්තූරයයි.
(2) ශ්‍රී ලංකාවේ අප ස්වාමිදුවගේ පින්තූරයයි.
(3) සදාසරණයේ දේවමාතාවන්ගේ පින්තූරයයි.
(4) ලූර්දු මාතාවන්ගේ පින්තූරයයි.
(5) පාතිමාවේ මාතාවන්ගේ පින්තූරයයි.

**12.** 16 වන ශත වර්ෂය වන තුරු ස්වාධීන කලාවක් ලෙස **නොසැලකූ** කලා මාධ්‍යය වන්නේ,
(1) සංගීතයයි.
(2) චිත්‍ර කලාවයි.
(3) අභිනයන කලාවයි.
(4) ගෘහ නිර්මාණ ශිල්පයයි.
(5) මූර්ති ශිල්පයයි.

**13.** ශක්තිය නික්මෙන මූල පිළිබඳව අදහස් දැක් වූ විද්‍යාඥයා වන්නේ,
(1) චාල්ස් ඩාවින් ය.
(2) සර් අයිසෙක් නිව්ටන් ය.
(3) තෙයියාර් ඩි ෂාර්ඩෑන් පියතුමා ය.
(4) ඇල්බට් අයින්ස්ටයින් ය.
(5) ආර්කිමිඩීස් ය.

**14.** බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ආපසු ජෙරුසලමට පැමිණි ඊශ්‍රායෙල් ජාතික කුමාරයා වන්නේ,
(1) ඒස්රා ය.
(2) නෙහෙමියා ය.
(3) ජොසියා ය.
(4) සෙරුබාබෙල් ය.
(5) සකරියා ය.

**15.** නෙස්ටෝරියන් වේදභේදය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ක්‍රිස්තුන් වහන්සේ තුළ දේවත්වය නැත.
(2) මරියතුමිය දෙවියන් වහන්සේගේ මව නොවේ.
(3) ක්‍රිස්තුන් වහන්සේ තුළ ස්වභාවයන් දෙකක් වෙන වෙනම පිහිටා ඇත.
(4) ක්‍රිස්තුන් වහන්සේට ඇත්තේ මවා ගත් ශරීරයක් පමණි.
(5) පුත්‍රයාණන් වහන්සේ පියාණන් වහන්සේ විසින් මවනු ලැබූවෙකි.

**16.** මැනිකිවාදය තුළ අඩංගු **නොවන** ප්‍රකාශය කුමක් ද?
(1) ආලෝකය සහ අන්ධකාරය වශයෙන් රාජ්‍යයන් දෙකකි.
(2) ආලෝකයේ රාජ්‍යය දෙවියන් වහන්සේ සතු ය.
(3) අඳුරේ රාජ්‍යය යක්ෂයා සතු ය.
(4) ආලෝකය සහ අන්ධකාරය යන බලවේග දෙකම සදාකල් පවතිනු ඇත.
(5) යක්ෂයා විසින් ආදම් මවන ලදී.

**17.** ස්ලාව් ජාතීන් අතර කිතු දහම පැතිරවීමට පෙරමුණ ගත්තේ,
(1) ශාන්ත සිරිල් සහ ශාන්ත මෙතෝදියස් යන දෙදෙනා ය.
(2) අයිඩන් නමැති තාපසතුමන් ය.
(3) ස්කොට්ලන්තයේ අපෝස්තුලුවරයා ලෙස සැලකෙන කොලොම්බන්තුමන් ය.
(4) ස්කැන්ඩිනේවියාවේ ශාන්ත අනෙස්කා තාපසතුමන් ය.
(5) ශාන්ත බොනිපස්තුමන් ය.



EXAMMOOD.LK EXAMMOOD.LK

**18.** "ශුද්ධ වූ සභාව අයර්ලන්තය තුළ වේගයෙන් ප්‍රචාරය වීමට නම් අයර්ලන්ත ජනතාව ඉදිරියට පැමිණිය යුතු ය." මෙසේ ප්‍රකාශ කළේ,
(1) ශාන්ත මහා ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා ය.
(2) ශාන්ත කොලොම්බන්තුමා ය.
(3) කැන්ටබරියේ ශාන්ත අගුස්තීනුතුමා ය.
(4) ශාන්ත පැට්රික්තුමා ය.
(5) ජර්මනියේ අපෝස්තුලුවරයා වන බෙනඩික්තුමා ය.

**19.** කුරුස යුද්ධය ඇතිවීමට හේතුව වූයේ,
(1) ඉස්ලාම් භක්තිකයන් විසින් කුරුසියට අවමාන කිරීම ය.
(2) මුස්ලිම් හමුදා යුරෝපය ආක්‍රමණය කිරීම ය.
(3) තුර්කි මුස්ලිම්වරුන්ගෙන් ශුද්ධ වූ දේශය මුදා ගැනීම ය.
(4) මුස්ලිම් හමුදා විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම වැළැක්වීම ය.
(5) රෝම අධිරාජ්‍යයේ බලය තවදුරටත් ව්‍යාප්ත කරවීම ය.

**20.** ආශ්‍රමික තාපස ජීවිතය ගොඩනැගීමට දායකත්වය දුන් තිදෙනෙකු ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ශාන්ත ඇතනේශියස්තුමා, ශාන්ත හිප්පෝ අගුස්තීනුතුමා හා ශාන්ත බෙනඩික්තුමා
(2) ශාන්ත හිප්පෝ අගුස්තීනුතුමා, ශාන්ත පකෝමියස්තුමා හා ශාන්ත බැසිල්තුමා
(3) ශාන්ත බෙනඩික්තුමා, ඊජිප්තුවේ ශාන්ත අන්තෝනිතුමා හා ශාන්ත හිප්පෝ අගුස්තීනුතුමා
(4) ශාන්ත ඇතනේශියස්තුමා, ශාන්ත පකෝමියස්තුමා හා ශාන්ත බැසිල්තුමා
(5) ශාන්ත බෙනඩික්තුමා, ඊජිප්තුවේ ශාන්ත අන්තෝනිතුමා හා ශාන්ත බැසිල්තුමා

**21.** ක්ලූනි තාපස ක්‍රමයෙන් බිහි වූ විශිෂ්ඨ පුද්ගලයන් තිදෙනෙකු වන්නේ,
(1) ශාන්ත බෙනඩික්තුමා, ශාන්ත බර්නාඩ්තුමා හා ශාන්ත පැට්රික්තුමා ය.
(2) ශාන්ත බර්නාඩ්තුමා, ශාන්ත හියුතුමා හා ශාන්ත බැසිල්තුමා ය.
(3) ශාන්ත හියුතුමා, ශාන්ත රොමොල්ඩ්තුමා හා ශාන්ත පීටර් ඩේමියන්තුමා ය.
(4) ශාන්ත රොමොල්ඩ්තුමා, ශාන්ත පැට්රික්තුමා හා ශාන්ත කොලොම්බන්තුමා ය.
(5) ශාන්ත පීටර් ඩේමියන්තුමා, ශාන්ත කොලොම්බන්තුමා හා ශාන්ත ග්‍රෙගරිතුමා ය.

**22.** 1850 සිට 1900 කාලය තුළදී යුරෝපයේ සිට ශ්‍රී ලංකාවේ සේවාව සඳහා පැමිණි කාන්තා පැවිදි පන්ති වන්නේ,
(1) ශුද්ධ වූ පවුලේ පැවිදි පන්තිය, අපෝස්තලික කාර්මෙල් පැවිදි පන්තිය හා ශුද්ධ වූ කුරුසියේ පැවිදි පන්තියයි.
(2) යහපත් එඬේරාගේ පැවිදි පන්තිය, දේව සංරක්ෂණයේ පැවිදි පන්තිය හා දොමිනිකාන සොහොයුරියන්ගේ පැවිදි පන්තියයි.
(3) ප්‍රැන්සිස්කාන පැවිදි පන්තිය, ශුද්ධ වූ පවුලේ පැවිදි පන්තිය හා ශුද්ධ වූ කුරුසියේ පැවිදි පන්තියයි.
(4) ශුද්ධ වූ පවුලේ පැවිදි පන්තිය, යහපත් එඬේරාගේ පැවිදි පන්තිය හා ප්‍රැන්සිස්කාන පැවිදි පන්තියයි.
(5) දයාවේ පැවිදි පන්තිය, අපෝස්තලික කාර්මෙල් පැවිදි පන්තිය හා දේව සංරක්ෂණයේ පැවිදි පන්තියයි.

**23.** මානව අයිතීන් සුරැකීම සම්බන්ධයෙන් කැප වූ තිදෙනෙකු ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ලියෝ නානායක්කාර රදගුරුතුමා, එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා, මයිකල් රොද්‍රිගු පියතුමා
(2) තිස්ස බාලසූරිය පියතුමා, ස්වාමි ඥානප්‍රගාසම් පියතුමා, එව්ලින් කානි මැතිනිය
(3) ගරු ලියෝ නානායක්කාර රදගුරුතුමා, පීටර් පිල්ලේ පියතුමා, දොන් පීටර් පියතුමා
(4) ලියෝ නානායක්කාර රදගුරුතුමා, ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා, මයිකල් රොද්‍රිගු පියතුමා
(5) ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා, පීටර් පිල්ලේ පියතුමා, දොන් පීටර් පියතුමා

**24.** පෘතුගීසි සමයේ සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ සැකසූ පියතුමන්ලා දෙදෙනා කවුරුන් ද?
(1) එම්මැනුවෙල් කොස්තා සහ පියෙරෙ බෙර්ගුවින්
(2) එම්මැනුවෙල් කොස්තා සහ අන්තෝනියෝ පෙක්ෂේවෝ
(3) පියෙරෙ බෙර්ගුවින් සහ ජාකොමේ ගොන්සාල්වෙස්
(4) ජාකොමේ ගොන්සාල්වෙස් සහ අන්තෝනියෝ පෙක්ෂේවෝ
(5) සෙබස්තියන් පොන්සේ සහ පියෙරෙ බෙර්ගුවින්

**25.** බ්‍රිතාන්‍ය පාලන සමයේ බිහි වූ දෙමළ කිතුනු සඟරා දෙකක් වන්නේ,
(1) පාදුකාවලන් හා ඥාණපල්ලු ය.
(2) උදය තාරකෙ හා සන්දියාගු මයෝ අම්මානෙ ය.
(3) ඥාණපල්ලු හා නාලු වේදම් ය.
(4) උදය තාරකෙ හා පදුකාවලන් ය.
(5) සන්දියාගු මයෝ අම්මානෙ හා නාලු වේදම් ය.

**26.** එංගලන්තයේ VIII වන හෙන්රි රජතුමා විසින් හිස ගසා මරාදමනු ලැබූ කතෝලික නීතිඥවරයා වන්නේ,
(1) තෝමස් ක්‍රෑන්මර් ය. (2) තෝමස් බිල්නි ය. (3) විලියම් ටින්ඩෙල් ය.
(4) තෝමස් විලියම් ය. (5) තෝමස් මුවර් ය.

**27.** විලියම් කේරිතුමන් ඇතුළත් වන පොතෙස්තන්ත සභාව වන්නේ,
(1) මෙතෝදිස්ත සභාව ය. (2) ඇන්ග්ලිකන් සභාව ය.
(3) දකුණු ඉන්දියානු සභාව ය. (4) බැප්ටිස්ට් සභාව ය.
(5) ලූතරන් සභාව ය.

**28.** ජේසු නිකාය ආරම්භ කරනු ලැබුයේ,
(1) ශාන්ත ඉග්නේෂියස් ලොයෙලාතුමා විසිනි.
(2) ශාන්ත ප්‍රැන්සිස් ක්ෂාවියර්තුමා විසිනි.
(3) කුරුසියේ ශාන්ත ජුවාම්තුමා විසිනි.
(4) ඇසීසියේ ශාන්ත ප්‍රැන්සිස්තුමන් විසිනි.
(5) ශාන්ත පීටර් ඩේමියන්තුමා විසිනි.

**29.** ක්‍රිස්තියානි එකමුතු සතිය පැවැත්වීමට මුලපිරුවේ,
(1) විලියම් කේරිතුමා ය.
(2) පියා කාදිනල්තුමා ය.
(3) 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.
(4) 6 වන පාවුළු ශුද්ධෝත්තම පියතුමා ය.
(5) පෝල් වොට්සන්තුමා ය.

**30.** සමාජ ප්‍රගතිය පිළිබඳව අදහස් දක්වන දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශය කුමක් ද?
(1) ක්‍රිස්තියානි නොවන ආගම් කෙරෙහි සබඳතාව පිළිබඳ ප්‍රකාශය - නොස්ට්‍රා අයිටාටෙ
(2) වර්තමාන ලෝකය තුළ ශුද්ධ වූ සභාව පිළිබඳ ප්‍රකාශය - ගවුඩියුම් ඒට් ස්පෙස්
(3) ශුද්ධ වූ සභාව පිළිබඳ ප්‍රකාශය - ලුමෙන් ජෙන්සියුම්
(4) ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශය - ඩිග්නිටාටිස් හුමානෙ
(5) දේව ප්‍රකාශනය පිළිබඳ ව්‍යවස්ථාව - ඩෙයි වර්බුම්

**31.** දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පැවැත්වෙද්දී ගිහියන්ට මූලිකත්වය දුන් දේවධර්ම ශාස්ත්‍රඥයා වන්නේ,
(1) කාර්ල් රාහ්නර්තුමා ය. (2) බෙයා කාදිනල්තුමා ය.
(3) ඊව්ස් කොන්ගාතුමා ය. (4) ජෝශප් රට්සින්ගර් කාදිනල්තුමා ය.
(5) XXIII වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.

**32.** බයිබලයේ 'වුල්ගාතා' හෙවත් 'වල්ගේට්' යන ලතින් පරිවර්තනය සිදු කරන ලද්දේ,
(1) ශාන්ත බැසිල්තුමා විසිනි. (2) ශාන්ත අගුස්තීනුතුමා විසිනි.
(3) ශාන්ත ජස්ටින්තුමා විසිනි. (4) ශාන්ත ඇතනේශියස්තුමා විසිනි.
(5) ශාන්ත ජෙරොම්තුමා විසිනි.

**33.** ක්‍රිස්තියානි තාපස නිකාය ආරම්භ වූ මුල් රටවල් දෙක මොනවා ද?
(1) ඊජිප්තුව සහ සිරියාව (2) සිරියාව සහ පලස්තීනය
(3) ඊජිප්තුව සහ මෙසදෝනියාව (4) පලස්තීනය සහ පර්සියාව
(5) සිරියාව සහ කොන්ස්තන්තිනෝපලය

**34.** පුරාණ ගිවිසුමේ සඳහන් **නොවන** කොටස වන්නේ,
(1) ඓතිහාසික හැඳින්වීම ය.
(2) අධිරාජයාගේ හෝ බලගතු රජතුමකුගේ ඓතිහාසික යහපත් ක්‍රියාවක් විස්තර කිරීම ය.
(3) ගිවිසුමට යටත්වන්නාගේ වගකීම පැහැදිලි කිරීම ය.
(4) දෙවිවරුන්ගේ නාම ලේඛනයක් ඇතුළත් කර තිබීම ය.
(5) ගිවිසුම බලපවත්නා කාලය සඳහන් කිරීම ය.

**35.** ඊශ්‍රායලීය රාජකීය සංස්ථාව බිහි වීමට හේතුවක් **නොවන්නේ,**
(1) විනිශ්චයකාරවරුන්ගේ අදක්ෂතාව ය.
(2) දේවමාලිගයේ වතාවත් අධීක්ෂණය කිරීම ය.
(3) ජාතික අනන්‍යතාවයක් ඇති කර ගැනීම ය.
(4) හමුදාවන්ට නායකත්වය දීම ය.
(5) අසල්වැසි සියලු රටවල් රජවරුන් විසින් පාලනය කිරීම ය.

[පස්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK EXAMMOOD.LK

**36.** ඓතිහාසික සිද්ධීන්වලට අදාළ පහත සඳහන් වගන්ති අතුරෙන් නිවැරදි වගන්ති තෝරන්න.

A - පෘතුගීසීන් විසින් කොළඹ බඩු ගබඩාවක් සහ දේවස්ථානයක් ගොඩනගන ලදී.

B - පෘතුගීසීන් විසින් දේවස්ථානය ශුද්ධ වූ ලෝරන්ස්තුමන්ට කැප කරන ලදී.

C - මායාදුන්නේ රජතුමා සීතාවක රාජ්‍යය පාලනය කළේ ය.

D - මායාදුන්නේ රජතුමා විසින් ධර්මපාල කුමරාව තමාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් පත් කිරීමට පෘතුගීසීන්ගේ සහාය පැතී ය.

E - VII වන බුවනෙකබාහු රජතුමා තමාගේ වැසියන්, කිතු දහම වැළඳ ගැනීමට ධෛර්යමත් කළේ ය.

(1) A සහ D (2) A සහ E (3) B සහ C (4) B සහ D (5) C සහ D

**37.** පහත සඳහන් ග්‍රන්ථ අතුරෙන් කුරුසියේ ශුද්ධ වූ ජුවාම්තුමා විසින් රචනා කරන ලද ග්‍රන්ථ මොනවා ද?

A - ප්‍රේමයේ ජීවමාන ගිනිදැල්ල - The Living Flame of Love

B - අධ්‍යාත්මික ගීතය - The Spiritual Canticle

C - කාර්මෙල් කන්ද නැගීම - Ascent of Mount Carmel

D - පදනම - The Foundation

E - ඇතුළාන්තර මන්දිරය - Interior Castle

(1) A, B සහ C (2) A, B සහ E (3) A, D සහ E (4) B, C සහ D (5) C, D සහ E

**38.** ශ්‍රී ලංකාවේ මෙතෝදිස්ත සභාවට සම්බන්ධ සේවාවක් **නොවන්නේ**,

(1) අධ්‍යාපන සේවාවයි.

(2) සෞඛ්‍ය සේවාවයි.

(3) අනාථ මඩම් පිහිටුවීමයි.

(4) සංවර්ධනය නොවූ ප්‍රදේශ සංවර්ධනය කිරීමයි.

(5) මන්නාරම් ප්‍රදේශය තුළ විශාල සේවාවක් සිදු කිරීමයි.

**39.** ශ්‍රී ලංකාවේ, බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයකු වන තෝමස් මෙට්ලන්ඩ් සිදු කළ වැදගත් ම සේවාව වන්නේ,

(1) මුළු ශ්‍රී ලංකාව පුරා පාසල් පිහිටුවීම ය.

(2) ආගමික නිදහස ඇති කිරීම ය.

(3) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීම ය.

(4) ආගම පැතිරවීම සඳහා ධර්මදූත කණ්ඩායම් ගෙන්වා ගැනීම ය.

(5) විධිමත් අධ්‍යාපනය අනිවාර්ය කිරීම ය.

**40.** ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරු කුලය සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?

(1) ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වයට වඩා මනුෂ්‍යත්වයට ප්‍රමුඛත්වය දී ඇත.

(2) ඉගැන්වීම්වලදී ප්ලේටෝගේ දර්ශන ක්‍රම උපයෝගී කර ගෙන ඇත.

(3) ක්‍රිස්තුවේදය සඳහා ජොහාන් සුවිශේෂය පාදක කොට ගෙන ඇත.

(4) ශුද්ධ වූ ලියවිලි ව්‍යංගාර්ථයෙන් ඉදිරිපත් කර ඇත.

(5) ශුද්ධ වූ බයිබලය විවරණයේදී ඓතිහාසික කරුණුවලට වඩා ව්‍යාකරණ රටාවට මුල් තැන දී ඇත.

**41.** පහත සඳහන් කරුණු අතුරෙන් ශාන්ත බැසිල්තුමා හඳුන්වා දුන් තාපස නීතිමාලාවට ඇතුළත් කරුණු පමණක් දැක්වෙන වරණය කුමක් ද?

A - තාපසයන් එක වහලක් යට ජීවත්විය යුතුයි.

B - තාපසයන් පොදු කාල සටහනකට අනුව දිවි ගෙවිය යුතුයි.

C - තාපසයන් ශාරීරික වෙහෙස යොදවා වැඩ කළ යුතුයි.

D - තමාට රුචි පරිදි තාපසයන්ට හුදකලාව කුටි තුළ යාච්ඤා කිරීමට අවසර තිබිය යුතුයි.

E - සතියකට දෙවරක් සියලු තාපසයන් එකට එක්වී තම අත්දැකීම් බෙදාගත යුතුයි.

(1) A, B සහ C (2) A, B සහ D (3) A, B සහ E (4) B, C සහ D (5) B, C සහ E

**42.** ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සමාජීය සහ දයාවේ සේවාව සඳහා කැප වූ කිතුනු ආයතන තුනක් වන්නේ,

(1) ශ්‍රී ලංකා කරිටාස්-සෙඩෙක් ආයතනය, ශාන්ත විසෙන්ති ද පාවුලා සමිතිය හා තරුණ ක්‍රිස්තියානි සංගමයයි.

(2) තරුණ ක්‍රිස්තියානි සංගමය, මරිය හමුදාව හා ශාන්ත විසෙන්ති පාවුලා සමිතියයි.

(3) දිව්‍ය හෘදයේ සමාගම, තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය හා ශ්‍රී ලංකා කරිටාස්-සෙඩෙක් ආයතනයයි.

(4) ශාන්ත විසෙන්ති ද පාවුලා සමිතිය, මරිය හමුදාව හා දිව්‍ය හෘදයේ සමාගමයි.

(5) ශ්‍රී ලංකා කරිටාස්-සෙඩෙක් ආයතනය, ළමා ධර්මදූත සමාජය හා කිතුණු කම්කරු ව්‍යාපාරයයි.

EXAMMOOD.LK
EXAMMOOD.LK

43. පහත සඳහන් ආයතන අතුරෙන් අධ්‍යාපනය, සංවාදය සහ සමාජීය කටයුතු වෙනුවෙන් මූලික ලෙස කැප වී ඇති ශ්‍රී ලංකාවේ කිතුනු ආයතන තුනක් දැක්වෙන වරණය කුමක් ද?
A - තුලන ආයතනය
B - සුබෝධි පූර්ණ අධ්‍යාපන ආයතනය
C - ශ්‍රී ලංකා කරිටාස් - සෙඩෙක් ආයතනය
D - සමාජීය සහ සාමයික ආයතනය (CSR)
E - කතෝලික ලේඛක සංගමය
(1) A, B සහ D (2) A, B සහ E (3) A, C සහ D (4) B, C සහ D (5) B, D සහ E

44. මානව අයිතීන් සුරැකීම සම්බන්ධයෙන් සභාව කැපවිය යුතු වන්නේ පහත සඳහන් කරුණු අතුරෙන් කුමන කරුණු මුල් කොට ගෙන ද?
A - මිනිසා දෙවියන් වහන්සේගේ සමානකමට හා ස්වරූපයට මැවූ උතුම් මැවිල්ලක් වීම
B - දෙවියන් වහන්සේම මනුෂ්‍යත්වය ගෙන මනුෂ්‍යයාගේ උතුම්කම පෙන්වා දීම
C - මනුෂ්‍යයන්ගෙන් ලෝකය හිස් වුවහොත් ලෝකය රැක බලා ගැනීමට කිසිවකු නැති වීම
D - මනුෂ්‍යයාට හිමි ගෞරවය රැක දීම හා සාධාරණත්වය ඉෂ්ට කිරීම
E - මනුෂ්‍යයන් තුළ අනෙක් සත්ත්වයනට හිමි නොවූ ඥාණය සහ නිදහස් කැමැත්ත තිබීම
(1) A, B සහ C (2) A, B සහ D (3) A, B සහ E (4) A, D සහ E (5) B, C සහ D

45. පහත සඳහන් වැකි සලකන්න.
A - පෘතුගීසී පාලන සමයේදී මෙරට ආරෝග්‍යශාලා තිබූ බව සඳහන් වේ.
B - ආගම් භේදයකින් තොරව සැමට ප්‍රතිකාර කළ ආරෝග්‍යශාලා දෙකක් ධර්මදූතවරුන් විසින් මන්නාරමේ පිහිටුවනු ලැබූහ.
C - වසංගත රෝග සම්බන්ධයෙන් තිබූ බිය නිසා ආරෝග්‍යශාලා බොහොමයක් වසා දැමීමට ධර්මදූතවරුන්ට සිදු විය.
D - මහනුවර ඇති වූ වසංගත සමයේදී ජුසේවාස්තුමන් එම රෝගීන්ට උපස්ථාන කිරීමේ නිරත වූයේ ය.
E - නිතර පැතිරුණු වසංගත රෝග නිසා ධර්මදූතවරුන් ශ්‍රී ලංකාවට පැමිණීමට බිය වූහ.
ඉහත සඳහන් වැකි අතුරෙන් විදේශීය පාලන සමයේදී ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය සම්බන්ධ නිවැරදි වගන්ති මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

46. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට සම්බන්ධ ශුද්ධෝත්තම පියතුමන්ලා දෙදෙනා වන්නේ,
(1) 12 වන පියුස් පාප්තුමා සහ 23 වන ජුවාම් පාප්තුමා ය.
(2) 23 වන ජුවාම් පාප්තුමා සහ I වන ජුවාම් පාවුලු පාප්තුමා ය.
(3) 6 වන පාවුලු පාප්තුමා සහ I වන ජුවාම් පාවුලු පාප්තුමා ය.
(4) 6 වන පාවුලු පාප්තුමා සහ II වන ජුවාම් පාවුලු පාප්තුමා ය.
(5) 23 වන ජුවාම් පාප්තුමා සහ 6 වන පාවුලු පාප්තුමා ය.

47. පහත සඳහන් වගන්ති අතුරෙන් එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමන්ට අදාළ **නොවන** වගන්තිය කුමක් ද?
(1) එතුමා පළමු සිංහල රදගුරුතුමන් ය.
(2) දේශීය සභාවක් ගොඩනැංවීම සඳහා එතුමා මහත් පරිශ්‍රමයක් දැරී ය.
(3) එතුමා දර්ශනවාදය සහ දේවධර්මය පිළිබඳ විශාරදයෙකි.
(4) එතුමා ලන්ඩන් විශ්වවිද්‍යාලයේදී බටහිර භාෂා පිළිබඳ නිපුණත්වයක් ලැබී ය.
(5) එතුමා දේව වන්දනාව ගැන මහත් උනන්දුවක් දැක් වූ අතර සිංහල ගීතිකා ද රචනා කළේ ය.

48. පහත සඳහන් වගන්ති අතුරෙන් අලිඝියේරි ඩාන්ටේට සම්බන්ධ **නොවන** වගන්තිය කුමක් ද?
(1) ඔහු ඉතාලියේ ෆ්ලොරන්ස් නගරයේ උපන්නේ ය.
(2) ඔහු ක්‍රිස්තියානි සාහිත්‍යය ගොඩනැංවීමට මහත් සේ දායක වූයේ ය.
(3) ඔහු ග්‍රීක භාෂාවෙන් ලියා ඇති ග්‍රන්ථ, ලතින් භාෂාවට පරිවර්තනය කළේ ය.
(4) ඔහු කාව්‍ය ග්‍රන්ථ තම මව්බස වූ ඉතාලි භාෂාවෙන් නිර්මාණය කළේ ය.
(5) 'දේව සුධාන්තය' (Divine Comedy) ඔහු විසින් ලියන ලද විශිෂ්ටතම ග්‍රන්ථය ලෙස සලකයි.

**49.** ජෝන් කැල්වින්තුමන් විසින් සම්පාදනය කරන ලද 'කිතුනු ආගමික සත්‍යතාවයන්' නමැති ග්‍රන්ථයේ සඳහන් **නොවන** කරුණ ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ලෝකය මැවුම්කාර දෙවියන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ ලබා දෙන ගැලවීම, ශුද්ධාත්මයාණන් වහන්සේ හා ශුද්ධ වූ සභාව
(2) ලෝකය මැවුම්කාර දෙවියන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ ලබා දෙන ගැලවීම, ස්වර්ගීය ජීවිතය හා නිරය
(3) ලෝකය මැවුම්කාර දෙවියන් වහන්සේ, ශුද්ධ වූ ත්‍රිත්වය, ක්‍රිස්තුන් වහන්සේගේ ගුණාංග හා ශුද්ධාත්මයාණන් වහන්සේ
(4) ශුද්ධ වූ ත්‍රිත්වය, ශුද්ධාත්මයාණන් වහන්සේ, ශුද්ධ වූ සභාව හා නිරය
(5) ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ ලබා දෙන ගැලවීම, ක්‍රිස්තුන් වහන්සේගේ ගුණාංග, ශුද්ධ වූ වන්දනාව හා මරියෝත්තමාවෝ

**50.** ඉන්දියාවට කිතු දහම ගෙන ආ අපෝස්තුලුතුමන් වශයෙන් සලකන්නේ කවුරුන් ද?
(1) ශුද්ධ වූ පිලිප් අපෝස්තුලුතුමා
(2) ශුද්ධ වූ බර්තලොමියුස් අපෝස්තුලුතුමා
(3) ශුද්ධ වූ ජූඩ් තදේයුස් අපෝස්තුලුතුමා
(4) ශුද්ධ වූ තෝමස් අපෝස්තුලුතුමා
(5) ශුද්ධ වූ ඇන්ඩෘ අපෝස්තුලුතුමා

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

2018.08.07 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

1. (i) ශුද්ධ වූ ජස්ටින්තුමාගේ ජීවිතය පිළිබඳව කරුණු **හතරක්** ලියන්න.
   (ii) ග්‍රීක සභා පිතෘන් **දෙදෙනෙකුගේ** හා ලතින් සභා පිතෘන් **දෙදෙනෙකුගේ** නම් ලියන්න.
   (iii) මුල් සභාවේ දේව ධර්මීය වර්ධනය සඳහා සභා පිතෘන් විසින් සිදු කළ සේවා **හතරක්** ලියන්න.
   (iv) තාපස ක්‍රමය ආරම්භක අවධියේ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
   (v) කාන්තාරයේ පියවරුන්ගේ ජීවිතයේ දක්නට තිබූ විශේෂ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

2. (i) මධ්‍යතන යුගයේ සභාවේ ලක්ෂණ **හතරක්** ලියන්න.
   (ii) මධ්‍යතන යුගයේදී සභාවේ ප්‍රතිසංස්කරණයට හේතු වූ ආගමික පසුබිම පිළිබඳ කරුණු **හතරක්** සඳහන් කරන්න.
   (iii) ක්ලුනි තාපස ක්‍රමයේ දක්නට තිබූ ආධ්‍යාත්මික ලක්ෂණ **හතරක්** ලියන්න.
   (iv) යාචක නිකා බිහිවීමට හේතු වූ කරුණු **හතරක්** ලියන්න.
   (v) සභාවට හා සමාජයට ශිෂ්ටර්ෂියන් තාපසවරුන්ගෙන් සිදු වූ සේවා **හතරක්** සඳහන් කරන්න.

3. (i) මැතිව් රිචි පියතුමාගේ ධර්මදූත ක්‍රියාවලියේ තිබූ විශේෂ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
   (ii) 18 හා 19 වන ශත වර්ෂවලදී චීනයේ සභාව මුහුණ දුන් අභියෝග **හතරක්** ලියන්න.
   (iii) ශාන්ත ප්‍රැන්සිස් ක්ෂේවියර්තුමාගේ කාලයේ සිට ජපානය තුළ කිතු දහම ප්‍රචලිත කිරීම සඳහා උපයෝගී කරගත් ක්‍රියාමාර්ග **හතරක්** දක්වන්න.
   (iv) 16 හා 17 වන ශත වර්ෂවලදී පෘතුගීසි ධර්මදූතවරුන් ශ්‍රී ලංකාව තුළ දී මුහුණ දුන් අභියෝග **හතරක්** සඳහන් කරන්න.
   (v) පළමුවරට පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට ශ්‍රී ලංකාව තුළ තිබූ රාජධානි **දෙකක්** හා ඒවායේ රජවරුන්ගේ නම් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

## II කොටස

4. සෑම කිතුනුවකුගෙන්ම නිවැරදි ජීවිත මාර්ගයක් හා යාගික කැපවීමක් බලාපොරොත්තු වන නිසා කිතුනු ශ්‍රාවකත්වය අභියෝගාත්මක එකකි.
   (i) ශුද්ධ වූ මැතිව්තුමන් විසින් ලියූ ශුද්ධ වූ ශුභාරංචියේ සඳහන් වන ආකාරයට භාග්‍ය අට තුළ හමුවන අභියෝගාත්මක කරුණු මොනවා දැ'යි සඳහන් කරන්න.
   (ii) "කිතුනු ජීවිතයට ක්‍රිස්තුන් වහන්සේගේ බැහැපත්කම අභියෝගාත්මක ආදර්ශයකි." සාකච්ඡා කරන්න.
   (iii) නූතන කිතුනු සමූහයන්ට මුල් කිතුනුවන්ගේ සාංඝික ජීවිතය අභියෝගාත්මක විය හැකි වන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න.
   (iv) "බෙනඩික්ටාන තාපස ජීවිතය කිතුනු ශ්‍රාවකත්වයේ අභියෝගාත්මක කරුණු සම්බන්ධයෙන් සාක්ෂි දරයි." සාකච්ඡා කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

**5.** යුරෝපීය ගෝත්‍රයන්ගේ ක්‍රමානුකූල සිත්හැරීම, සභාවේ වර්ධනය සඳහා විවිධාකාර ලෙස උපකාරී වී ඇත.

(i) යුරෝපීය ගෝත්‍ර ක්‍රමානුකූල ලෙස කිතු දහම වැළඳ ගැනීමට හේතු මොනවා දැ'යි පැහැදිලි කරන්න.

(ii) අයර්ලන්තය කිතු දහම වැළඳ ගැනීමේදී ශුද්ධ වූ පැට්‍රික්තුමන්ගේ දායකත්වය අගයන්න.

(iii) නමවන ශත වර්ෂය එළඹෙන විට, යුරෝපයේ සියලු ගෝත්‍ර කිතු දහම වැළඳ ගැනීම යුරෝපීය සමාජයේ ඉක්මන් සංවර්ධනයට බලපෑ ආකාරය පැහැදිලි කරන්න.

(iv) සභාවේ වර්ධනය සඳහා මහා චාල්ස් අධිරාජයාගෙන් සිදු වූ සේවාව පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

**6.** ක්‍රිස්තියානි ඉගැන්වීම් හා වටිනාකම් ප්‍රකාශ කිරීමේදී ක්‍රිස්තියානි කලා මාධ්‍ය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇත.

(i) මුල් කාලයේදී කිතුනු ආගමික චිත්‍ර කිතුනු ඇදහිල්ලට හා සංකේතාත්මක සන්නිවේදනයට දායක වී ඇති ආකාරය විස්තර කරන්න.

(ii) රෝමානු ශෛලියේ කලා නිර්මාණ තුළ දක්නට ඇති විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

(iii) ෆ්‍රෙස්කෝ චිත්‍රවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවා දැ'යි දක්වන්න.

(iv) සාධනීය කිතුනු ධර්මෝපදේශයක් බිහි කිරීම සම්බන්ධයෙන් කිතුනු කලාවේ විශේෂිත දායකත්වය කුමක් දැ'යි පැහැදිලි කරන්න.

**7.** බ්‍රිතාන්‍ය පාලන සමයේදී කිතු දහම ශ්‍රී ලංකා සමාජයේ යහපත උදෙසා සැලකිය යුතු සේවාවක් සිදු කර ඇත.

(i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නගාලීම සඳහා ප්‍රොතෙස්තන්ත ධර්මදූතවරුන්ගේ දායකත්වය කෙසේ දැ'යි පැහැදිලි කරන්න.

(ii) බ්‍රිතාන්‍ය පාලන සමයේදී ප්‍රොතෙස්තන්ත ධර්මදූතවරුන් විසින් සිදු කරන ලද දයාවේ සේවාවන් පිළිබඳව විස්තර කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේදී කතෝලිකයින් විසින් අත්දුටු වාසි හා අවාසි මොනවා දැ'යි පැහැදිලි කරන්න.

(iv) බ්‍රිතාන්‍ය පාලන සමයේදී ශ්‍රී ලාංකික සමාජය වෙත බලපෑ කිතුනු වටිනාකම් පිළිබඳව විස්තර කරන්න.

**8.** සභාවේ ඉගැන්වීම් මගින් සමාජය තුළ සාමය සහ සංහිඳියාව නංවාලීමට හැකි විය.

(i) ආසියානු රදගුරු සමුළු සම්මේලනයේ (FABC) ආරම්භය සහ විකාශනය පිළිබඳව විස්තර කරන්න.

(ii) ආසියානු රදගුරු සමුළු සම්මේලනය මගින් සාමය සහ සංස්කෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ඉගැන්වීම් පැහැදිලි කරන්න.

(iii) ජගත් කිතුනු සභා සම්මේලනය (WCC) මගින් සාමය සහ කිතුනු සභා එකමුතුව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ඉගැන්වීම් පිළිබඳ විස්තර කරන්න.

(iv) ශ්‍රී ලංකා සමාජයේ ඇති විවිධ ගැටුම් හමුවේ සාමය සහ සංහිඳියාව ඇති කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔබගේ අදහස් පැහැදිලි කරන්න.

* * *

EXAMMOOD.LK